## හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව

### 1. මූල්‍ය ප්‍රකාශන.

#### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 09 දිනද , ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 05 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 ජූලි 26 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

#### 1.2 මතය.

සභාපතිවරයා වෙත යවන ලද වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතු කොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති හඟුරන්කෙත ප්‍රාදේශිය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

#### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

##### 1.3.1 විගණනය සඳහා සාක්ෂි නොවීම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 84,981,908 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.

#### 2.1 මූල්‍ය ප්‍රතිඵල.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,066,820 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,356,211 ක් විය.

#### 2.2 මූල්‍ය පාලනය.

අංක 022-0-001-3-5263226 දරන බැංකු ගිණුමේ 2006 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා වූ බැංකු සැසඳුම් ප්‍රකාශ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 395 (ඇ) නියමය අනුව 2012 මාර්තු 16 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය.

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය. | | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය. |
|---|---|---|---|---|
| | | රු. '000 | රු. '000 | රු. '000 |
| (I). | වරිපනම් හා බදු | 790 | 648 | 906 |
| (II). | බදු කුලී | 1,089 | 917 | 591 |
| (III). | බලපත්‍ර ගාස්තු. | 1,050 | 1,050 | - |
| (IV) | වෙනත් ආදායම්. | 1,996 | 2,079 | 664 |

### 2.3.2 ආදායම් අයකිරීම.

(අ). රිකිල්ලගස්කඩ නගරයේ වාහන නවතා තැබිය හැකි ස්ථාන නම්කර අතුරු ව්‍යවස්ථා පැනවීම මගින් වාහන නවතා තැබීමේ ගාස්තු අයකිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ). මතුරට උපකාර්යාලයට අයත් වරිපනම් කලාප වල 2010 හා 2011 වර්ෂ වලට අදාළ ' කේ ' පෝරම 2011 දෙසැම්බර් 31 දින වනවිටද බෙදාහැර නොතිබුණි.

### 2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු.

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 209,000 |
| (ii) | මුද්දර ගාස්තු | 1,210,862 |

2.4 නිශ්ක්‍රීය සහ ඌන උපයෝජිත භෞතික සම්පත්

මැදරට පළාත් පාලනයේ තොරතුරු තාක්ෂණ ප්‍රවර්ධන ව්‍යාපෘතිය සඳහා මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් 2011 ජූනි 20 හා අගෝස්තු 08 යන දිනවලදී ලබාදී තිබූ රු.188,738 ක් වටිනා උපකරණ විගණන දිනවූ 2012 මාර්තු 16 දින වන විටත් කිසඳු ප්‍රයෝජනයකට නොගෙන නිශ්කාර්යව පැවතුණි.

2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා.

(අ). සභා බල ප්‍රදේශය තුල පිහිටි ක්‍රීඩාපිටි දෙකක් සංවර්ධනය කිරීම සඳහා 2010 වර්ෂයේ පළාත් සභා මන්ත්‍රී ආධාර යටතේ ලබාදී තිබූ රු.150,000 ක් ඉඩම්වල ආරවුල් පැවතීම හේතුවෙන් ඉටුවී නොතිබුණි.

(ආ). 2010 වර්ෂයේ පළාත් සභා මන්ත්‍රී ආධාර යටතේ රු.81,880 ක් වැයකර මිලදීගන්නා ලද වල්කපන යන්ත්‍ර 02 කින් එක් යන්ත්‍රයක් විගණන පරීක්ෂණ දිනවූ 2011 සැප්තැම්බර් 30 දින විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ). රිකිල්ලගස්කඩ නගරයේ පොදු වෙළඳපල සහ තැපැල් කාර්යාලය අතර පිහිටි ප්‍රාදේශීය සභාවට අයත් බිම් කොටසේ ව්‍යාපාරික ස්ථානයක් සඳහා අනවසර ඉදිකිරීමක් කර තිබුණි.

(ඈ). 1988 පාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ 59 රීතිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය ආරම්භයේදී ආදායම් පරීක්ෂක විසින් සභා බල ප්‍රදේශය තුල වූ කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි.

(ඉ). සභාවේ, කළමනාකරණ සහකාර නිලධාරීන් 11 දෙනෙකු හා වැඩසටහන් සහකාර නිලධාරීන් දෙදෙනෙකු සිටියදී කාර්යාල කාර්ය සහයක වරයෙකු මතුරට උපකාර්යාලයේ කාර්යභාර නිලධාරි වශයෙන් පත්කර තිබුණි.

(ඊ). සභාවේ, කළමනාකරණ සහකාර නිලධාරීන්ගේ පුරප්පාඩු නොපැවතියදී කළමනාකරණ සහකාර නිලධාරීන්ගේ රාජකාරි, කාර්යාල කාර්ය සහායකයින් සිව් දෙනෙකු වෙත පවරා තිබුණි.

(උ). 2010 දෙසැම්බර් 31 දිනට සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණය අනුව රු.40,689 ක් වටිනා පුස්තකාල පොත් හා භාණ්ඩ ඌනතා සම්බන්ධයෙන් ඊට වගකිවයුතු පාර්ශවයන් නිශ්චය කර සභාවට සිදුවී ඇති අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය.

(අ). මධ්‍යම පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත 2010 වර්ෂයේදී රු.3,105,467 ක් වැයකර ඉදිකරන ලද කසල ප්‍රතිචක්‍රියකරණ මධ්‍යස්ථානයේ රැස්කරන ලද කැලිකසළ මගින් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කර තිබුණද විගණන පරීක්ෂණ දිනවූ 2012 මාර්තු 14 දින වන විටත් නිෂ්පාදනය කර තිබුණේ කොම්පෝස්ට් පොහොර කිලෝග්‍රෑම් 10 ක් පමණි.

(ආ). කසල ප්‍රතිචක්‍රීයකරන මධ්‍යස්ථානය සඳහා අපේක්ෂිත ආකාරයට රැස් නොකරන ලද කසල දැමීම සඳහා එම මධ්‍යස්ථාන භූමියේ 2011 ඔක්තෝබර් මාසයේදී රු.42,680 ක් වැයකර කසල වලක් කපා තිබුණ අතර විගණන දිනය වූ 2012 මාර්තු 16 දින වන විට එම කසළ වල පිරිගොස් තිබුණි. කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ කටයුතු පිළිබඳව සභාවේ පරිසර නිලධාරියාගේ සෘජු හා නිරන්තර අධීක්ෂණයක් සිදු නොවන බව නිරීක්ෂණය විය.

(ඇ). රැස්කරන කැලිකසළ වලින් කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීම සඳහා 2010 වර්ෂයේදී රු.3,105,467 ක වියදමින් ඉදිකළ කසල ප්‍රතිචක්‍රීයකරන මධ්‍යස්ථානය හා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ලැබී තිබු ප්‍රතිපාදන වලින් 2011 වර්ෂයේදී රු.3,029,766 ක වියදමින් ඉදිකළ මධ්‍යස්ථානය සඳහා ජලය සපයා ගැනීමට ජල මූලාශ්‍රයක් නොමැතිවීම නිසා අපේක්ෂිත ප්‍රතිඵල ලබාගත නොහැකි තත්ත්වයක පැවතුණි.

(ඈ). හඟුරන්කෙත පොදු වැසිකිලයේ අපද්‍රව්‍ය බාහිර පරිසරයට එක් වීම නිසා හඟුරන්කෙත පොලීසිය විසින් ප්‍රාදේශීය සභාවට එරෙහිව පවරන ලද නඩුවේදී අධිකරණය විසින් ලබාදුන් තීන්දුව අනුව ප්‍රාදේශීය සභාව විසින් මහනුවර මහේස්ත්‍රාත් අධිකරණය වෙත රු.45,000 ක දඩයක් ගෙවා තිබුණි.

2.7 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාකාර සැලැස්මක් සකස් කර නොතිබුණු බැවින් වාර්ෂික ක්‍රියාකාර සැලැස්මට අනුකුල නොවීම, මූල්‍ය හා භෞතික කාර්ය සාධනයේ විචලනයන් සඳහා ක්‍රියාමාර්ග නොගැනීම, ඉලක්කගත අරමුණු කරා ලඟා නොවීම පිළිබඳ කාර්ය සාධනය ඇගයීමට නොහැකි විය.

2.8 කොන්ත්‍රාත් පරිපාලනය.

මධ්‍යම පළාත් සභා ප්‍රතිපාදන මත 2011 වර්ෂයේදී රු.449,757 ක් වැයකර වැගම ඉදිකර තිබූ ඝන අපද්‍රව්‍ය එකරැස්කිරීමේ මධ්‍යස්ථානය 2012 මාර්තු 14 වෙනි දින පරීක්ෂා කිරීමේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i.) වහලයේ සෙවිලි තහඩු වලට ගැළපෙන මුදුන් තහඩු සවිකර නොතිබුණි.
( ii.) වඩිම්බු ලෑලි දිරාපත්වී තිබුණු අතර ඒවා පුපුරා තිබුණි.
(iii.) වඩිම්බු ලෑලි, පරාළ වලට නියමිත පරිදි සවිකර නොතිබුණි.
(iv.) වහලයට සෙවිලි තහඩු සවිකිරීම සඳහා යකඩ ඇණ භාවිතා කිරීම නිසා සෙවිලි තහඩු පළුදුවී තිබුණි.
(v.) වහලයේ යටලී ඇදවී තිබූ අතර ඒ සඳහා මුක්කු යොදා තිබුණි.
(vi.) වහලය සඳහා මුදුන් යටලීයක්ද සවිකර නොතිබුණි.
(vii.) ගොඩනැගිල්ලේ බිත්ති සහ සිමෙන්ති පොළවේ නිමාව අසතුටුදායක තත්ත්වයේ පැවති අතර සිමෙන්ති පොළව බොල්වී තිබුණි.

2.9 අභ්‍යන්තර විගණනය.

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.